කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

(නව / පැරණි නිර්දේශය)

සමාජීය විද්‍යා පීඨය

දේශපාලන විද්‍යාව - POLS - E 1025

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය සහ දේශපාලනය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. i. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ පැහැදිලි කරන්න.

ii. එම ප්‍රතිසංස්කරණ ලංකාවේ සමාජ, ආර්ථික සහ දේශපාලන ක්ෂේත්‍රය කෙරෙහි සිදු කරන ලද බලපෑම සාකච්ඡා කරන්න.

02. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ පහත සඳහන් මාතෘකා **දෙකක්** විවේචනාත්මකව විමසන්න.

i. ආණ්ඩුකාරවරයා
ii. රාජ්‍ය නිලධාරීන් තිදෙනා
iii. රාජ්‍ය මන්ත්‍රණ සභාව
iv. විධායක කාරක සභා ක්‍රමය

03. i. ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමයේ මූලික ලක්ෂණ මොනවාද?
ii. එහි ශක්‍යතා සහ දුර්වලතා සාකච්ඡා කරන්න.

එක්කෝ

04. ශ්‍රී ලංකාවේ 1947-1972 දක්වා වූ කාලයේ ක්‍රියාත්මක වූ කැබිනට් ක්‍රමයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය විභාග කරන්න.

නැතහොත්

"සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙස්ට්මිනිස්ටර් ආකෘතිය මත පදනම් වූවකි." කරුණු සහිතව ඔබේ අදහස් දක්වන්න.

05. ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ වූ ජාතික රාජ්‍ය සභාව සහ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වූ පාර්ලිමේන්තුවේ බලතල සහ කාර්යභාරය තුලනාත්මකව පරීක්ෂා කරන්න.

06. ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම්, 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ වූ මූලික අයිතිවාසිකම් සමග තුලනාත්මකව පරීක්ෂා කරන්න.

07. ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් ඒවායේ සම්බන්ධතාව සාකච්ඡා කරන්න.

i. ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව
ii. ජනාධිපතිවරයා සහ රාජ්‍ය සේවය

08. ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දුන් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මූලික ලක්ෂණ සාකච්ඡා කරන්න.

09. පහත සඳහන් මාතෘකාවලින් **<u>දෙකක් (02)</u>** පිළිබඳව සටහන් ලියන්න.

i. ලංකා ජාතික සංගමය
ii. 1978 ව්‍යවස්ථාව යටතේ වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල සහ කාර්යභාරය
iii. විධායක ජනාධිපතිවරයා සහ පළාත් සභා අතර සම්බන්ධතාව
iv. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල කාර්යභාරය

********************************